# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ)
## (සංශෝධන)

**1979 අංක 59 දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා විසින් 2017 නොවැම්බර් මස 25 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 නොවැම්බර් මස 08 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[219 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 40.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 15.00 යි.**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2—PL 010492—510 (2017/11)

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) පනත සඳහා පොදු සංශෝධනයක් ගෙන එනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ විෂයයට අදාළව ලේකම්වරයා සතු කර්තව්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරීම ය.

***3 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හා බලාත්මක කිරීමේ බලතල පැවරී ඇති තැනැත්තන් වශයෙන් වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අමාත්‍යවරයා විසින් ලිඛිතව නමින් හෝ ධුරයෙන් පත්කරනු ලබන වෙනත් යම් තැනැත්තකු ඇතුළත් කිරීම ය.

***4 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ -

(1) (i) යම් අත්හැර දමන ලද විදේශීය ධීවර බෝට්ටුවක් ආසන්නතම වරාය කරා ගෙන ඒම;

(ii) මෙම පනත යටතේ අවස්ථාවෝචිත පරිදි, තහනමට ගන්නා ලද හෝ රඳවාගන්නා ලද යම් විදේශීය ධීවර බෝට්ටු හා එහි කාර්ය මණ්ඩල එම බෝට්ටුව අත්හැර දමා නොමැති අවස්ථාවක දී ප්‍රායෝගික අපහසුතා මගහරවා ගැනීම පිණිස මහාධිකරණය වෙනුවට මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීම,

සඳහා යම් බලයලත් නිලධරයකු වෙත හැකියාව ලබාදීම; සහ

(2) අධ්‍යක්ෂවරයා හෝ දිසාපතිවරයා සතු බලය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරීම ය.

***5 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, 13අ අලුත් වගන්තිය හඳුන්වා දෙනු ලබයි. සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ අත්හැර දමන ලද හෝ තහනමට ගන්නා ලද විදේශීය ධීවර බෝට්ටුව අයත් රටේ කොන්සල්වරයාට නිශ්චිතව සඳහන් විස්තර ඇතුළත් දැන්වීමක් භාරදීම සඳහා සහ රඳවාගැනීම සම්බන්ධයෙන් වන ගාස්තු සහ ආනුෂංගික වියදම් ශ්‍රී ලංකා රජය වෙත ආපසු අයකර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම ය.

***6 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ දේශීය ජල තීරයේ දී හා ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපය තුළ දී පනතේ 4 වන වගන්තිය හා 5 වන වගන්තිය උල්ලංඝනය කරමින් සිදු කරනු ලබන වැරදි සඳහා ධීවර බෝට්ටුවේ දිග මත පදනම්ව වැඩි දඩ මුදල් පනවනු ලැබීම ය.

***7 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ මෙම පනත යටතේ සිදු කරන ලද වැරදි සම්බන්ධයෙන් බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරුන් වෙත හැකියාව ලබාදීම සහ විදේශීය ධීවර බෝට්ටුවක් විසින් යම් බලපත්‍රයක කොන්දේසි උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වන දඩ මුදල් වැඩි කිරීම ය.

***8 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බලයලත් නිලධරයන්ට බාධා කිරීමේ වරද සඳහා ධීවර බෝට්ටුවේ දිග සැලකිල්ලට ගනිමින් වැඩි දඩ මුදල් පනවනු ලැබීම සම්බන්ධයෙන් බලය ක්‍රියාත්මක කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරුන් වෙත හැකියාව ලබාදීම ය.

***9 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 17අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ මෙම පනත යටතේ සිදු කරන ලද සියලු වැරදි සංඥෙය හා ඇප ලබා දිය නොහැකි වැරදි බවට පත් කිරීම ය.

***10 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 8 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***11 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ අභියාචනා මුල් අවස්ථාවේ දී විභාග කිරීමේ හැකියාව මහාධිකරණය වෙත ලබා දෙමින් නැවත එම අභියාචනා අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දීම සහ අධ්‍යක්ෂවරයා යන නිල නාමය අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් වෙනස් කිරීමය.

***12 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 19අ, 19ආ සහ 19ඇ අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තිවල නීතියේ බලපෑම වනුයේ මහෙස්ත්‍රාත්වරයා වෙත නියමිත කාලසීමාව තුළ අදාළ පාර්ශ්වය විසින් තම නීත්‍යානුකූල හිමිකම ඔප්පු කරනු ලබන තෙක් අත්හැර දමන ලද විදේශීය ධීවර බෝට්ටුවේ හිමිකාරත්වය රජය වෙත පැවරීමය.

***13 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ අනන්‍ය ආර්ථික කලාපය තුළ දී පළමුවරට සිදුකරන ලද වැරදි සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සමග දණ්ඩනයක් පනවනු ලැබීම සඳහා විධිවිධාන සැලැස්වීම ය.

***14 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 20අ අලුත් වගන්තිය ඇතුළත් කරමින් එහි 20 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ විශේෂඥ මණ්ඩලයක් පත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම ය.

***15 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ යම් නඩු විභාගයක් අවසන් වනතෙක් සෑහීමට පත් විය හැකි බැදුම්කරයක් හෝ ඇපයක් ලබා දීම මත යම් බෝට්ටුවක් නිදහස් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ මේ පනත යටතේ සිදු කරන ලද වැරදි සම්බන්ධයෙන් බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයා වෙත හැකියාව ලබා දීම ය.

***16 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ යම් විදේශීය ධීවර බෝට්ටුවක් ශ්‍රී ලංකා ජල තීරය තුළ සොයා ගනු ලැබූවිට පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම පිළිබඳ පූර්ව නිගමනයක් ඇති කර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම ය.

***17 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ මෙම පනත යටතේ සිදු කරන ලද වැරදි සම්බන්ධයෙන් බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයා වෙත හැකියාව ලබා දීම ය.

***18 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ජාත්‍යන්තර සම්මුති සහ එකඟතාවන්හි නියම කර ඇති ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම සඳහා නියෝග සාදනු ලැබීමේ බලය පුළුල් කිරීම ය.

***19 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියට 26අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ නියෝග උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් දඩයක් පැනවීමය.

***20 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියට 27අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ධීවර ත්‍යාග අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවීම ය.

***21 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ "අත්හැර දමන ලද විදේශීය ධීවර බෝට්ටුව" සහ "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන යෙදුම් සඳහා අලුත් අර්ථ නිරූපණයන් ඇතුළත් කිරීම සහ "මසුන්", "මසුන් ඇල්ලීම", "දේශීය ධීවර බෝට්ටුව", "අදාළ කටයුතු", "ලේකම්වරයා" සහ "ශ්‍රී ලංකා ජල තීරය" යන යෙදුම් සඳහා අර්ථ නිරූපණයන් ආදේශ කිරීම ය.

# ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) (සංශෝධන)

එල්.ඩී.–ඕ. 20/2016

**1979 අංක 59 දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2017 අංක      දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1979 අංක 59 දරන පනතේ පොදු සංශෝධනය.

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 59 දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) පනතේ "ලේකම්වරයා" යන වචනය ප්‍රධාන ප්‍රඥප්තියේ හෝ යම් නියෝගයක, රීතියක, දැන්වීමක හෝ නිවේදනයක යෙදෙන කවර හෝ අවස්ථාවක දී ඒ වචනය වෙනුවට "අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(i) එම වගන්තියේ පැතිසටහන ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"මේ පනත ක්‍රියාත්මක කිරීමේ දී හා බලාත්මක කිරීමේ දී සන්නද්ධ සේවාවන් ආදිය විසින් සහයෝගය ලබාදිය යුතු බව.";

(ii) එම වගන්තියේ "සන්නද්ධ සේවාවන් හි හමුදාපතිවරයන් විසින්" යන වචන වෙනුවට "සන්නද්ධ සේවාවන්හි හමුදාපතිවරයන්, 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පනත යටතේ පිහිටුවන ලද වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වෙරළ ආරක්ෂක අධ්‍යක්ෂ-ජනරාල්වරයා සහ ලියවිල්ලක් මඟින් අමාත්‍යවරයා විසින්, නමින් හෝ ධුරයෙන් පත් කරනු ලබන වෙනත් යම් තැනැත්තකු විසින්" යන වචන ආදේශ කිරීමෙන්;".

2—PL 010405—475 (2017/10)

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(i) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(4) (අ) (2) වන උපවගන්තියේ (අ) අනුඡේදය යටතේ තහනමට ගත් සහ රඳවාගත් යම් විදේශීය ධීවර බෝට්ටුවක් හෝ අත්හැර දමන ලද යම් විදේශීය ධීවර බෝට්ටුවක්; සහ

(ආ) (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ අත්අඩංගුවට ගත් යම් තැනැත්තකු,

ශ්‍රී ලංකාවේ වඩාත් ආසන්නතම හෝ වඩාත් පහසු වරාය වෙත රැගෙන යා යුතු ය.";

(ii) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(5) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් විදේශීය ධීවර බෝට්ටුවක් හෝ වෙනත් යම් දෙයක් මේ වගන්තිය යටතේ තහනමට ගන්නා අවස්ථාවක දී, ඒ බෝට්ටුව හෝ වෙනත් දෙය තහනමට ගනු ලැබුවේ යම් බලයලත් නිලධරයකු විසින් ද ඒ නිලධරයා විසින් හැකිතාක් ඉක්මණින් එම වෙනත් යම් දෙයක් ඇතුළත් එම බෝට්ටුව (4) වන උපවගන්තිය යටතේ විදේශීය ධීවර බෝට්ටුව හා තැනැත්තන් ගෙන එනු ලැබුවේ යම් වරායක් වෙත ද ඒ පිළිබඳ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. නැතහොත් ඒ බෝට්ටුව හෝ වෙනත් දෙය සම්බන්ධයෙන් පවරනු ලැබූ නඩුවක් අවසාන වන තෙක් ඒ බෝට්ටුව හෝ වෙනත් දෙය රඳවා තැබීමට හෝ එහි භාරකාරත්වය සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයා විසින් සුදුසු යයි සලකනු ලබන ආඥාවක් කරනු ලැබීම සඳහා එම බෝට්ටුව හෝ වෙනත් දෙය මහෙස්ත්‍රාත්වරයා විසින් පරීක්ෂා කිරීමට සැලැස්විය යුතු ය:

එසේ වුව ද, එසේ තහනමට ගත් මසුන් හෝ ජලජ පැලෑටි කිසිවක් ඉතා ඉක්මණින් නරක්වන සුළු වන විට අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ හෝ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බලය දෙන ලද යම් තැනැත්තකුගේ තීරණය මත යම් බලයලත් නිලධරයකු විසින් ඒ මත්ස්‍යයන් හෝ ජලජ පැලෑටි අලෙවි කර ඒ මුදල් මහෙස්ත්‍රාත් අධිකරණයේ තැන්පත් කළ යුතු ය.";

(iii) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ "සිරභාරයට ගනු ලැබූ ස්ථානයේ සිට මහාධිකරණ විනිශ්චයකාරවරයා" සහ "මහාධිකරණ විනිශ්චයකාරවරයා" යන වචන වෙනුවට පිළිවෙලින් "සිරභාරයට ගනු ලැබූ ස්ථානයේ සිට මහෙස්ත්‍රාත්වරයා" සහ "මහෙස්ත්‍රාත්වරයා" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13අ සහ 13ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**5.** 13 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 13අ වගන්තිය සහ 13ආ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු යː-

"විදේශීය නැව් රඳවා ගැනීම පිළිබඳ කොන්සල් නිලධරයා වෙත දැනුම් දීම.

13.අ (1) (අ) මේ පනත යටතේ යම් විදේශීය ධීවර බෝට්ටුවක් රඳවා ගත් හෝ තහනමට ගත් අවස්ථාවක දී; සහ

(ආ) යම් විදේශීය ධීවර බෝට්ටුවක නෞකාධිපතිට, අයිතිකරුට හෝ එය කුලියට ගත් තැනැත්තකු ඇත්නම් ඔහුට එරෙහිව මේ පනත යටතේ යම් නඩු කටයුත්තක් පවරා ඇති අවස්ථාවක දී,

විදේශ කටයුතු විෂයය පවරා ඇති අමාත්‍යවරයා මගින් ධීවර බෝට්ටුව අයත් වන්නා වූ රටේ කොන්සල් නිලධරයා වෙත නොපමාව දැන්වීමක් භාරදිය යුතු ය.

(2) බෝට්ටුව තහනමට ගෙන ඇත්තේ හෝ රඳවා ගෙන ඇත්තේ නැතහොත් නඩු කටයුත්ත පවරනු ලැබ ඇත්තේ කුමන හේතු මත ද යන්න (1) වන උපවගන්තිය යටතේ භාරදෙනු ලබන දැන්වීමක නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

ගාස්තු සහ අලාභ සඳහා යටත් විය යුතු බව.

13ආ. මේ පනතේ 19ආ වගන්තියේ කුමක් සඳහන්ව තිබුණ ද, මේ පනත යටතේ යම් අත්හැර දමන ලද විදේශීය ධීවර බෝට්ටුවක් රඳවාගත් හෝ තහනමට ගනු ලැබූ අවස්ථාවක දී, එම විදේශීය ධීවර බෝට්ටුවේ නෞකාධිපති, අයිතිකරු හෝ එය කුලියට ගත් තැනැත්තකු ඇත්නම් ඔහු විසින් ඒ විදේශීය ධීවර බෝට්ටුව රඳවාගැනීමේ සහ සෝදිසි කිරීමට අදාළ ගාස්තු සහ වෙනත් ආනුෂංගික වියදම් ශ්‍රී ලංකා රජයට ගෙවීමට යටත් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ:-

"දේශීය ජල තීරයේ දී 4 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීම වරදක් විය යුතු බව.

15. 4 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය වන අයුරින් දේශීය ජල තීරයේ, ඓතිහාසික ජල ප්‍රදේශයේ, පොදු වරායවල, ගංගා, විල්, කලපු, මෝය, දිය පාරවල්, වැව්, ජලාශ, පොකුණු, ඇලවල් සහ වෙනත් සියලු රට මැද පොදු හෝ අභ්‍යන්තර ජල ප්‍රදේශවල යම් විදේශීය ධීවර බෝට්ටුවක් භාවිත කරන අවස්ථාවක දී, ඒ බෝට්ටුවේ නෞකාධිපති, අයිතිකරු සහ එය කුලියට ගත් තැනැත්තා හෝ ඒ බෝට්ටුවේ ගමන් කරනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, එම එක් එක් තැනැත්තා මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ මෙහි I වන උපලේඛනයේ I වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති ධීවර බෝට්ටුවේ දිග ප්‍රමාණය මත පදනම්ව මෙහි I වන උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති මුදලට නොඅඩු දඩයකට යටත් විය යුතු ය.

දේශීය ජල තීරයේ දී 5 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීම වරදක් විය යුතු බව.

15අ. 5 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය වන අයුරින් දේශීය ජල තීරයේ, ඓතිහාසික ජල ප්‍රදේශයේ, පොදු වරායවල, ගංගා, විල්, කලපු, මෝය, දිය පාරවල්, වැව්, ජලාශ, පොකුණු, ඇලවල් සහ වෙනත් සියලු රට මැද පොදු හෝ අභ්‍යන්තර ජල ප්‍රදේශවල යම් විදේශීය ධීවර බෝට්ටුවක් භාවිත

කරන අවස්ථාවක දී ඒ බෝට්ටුවේ නෞකාධිපති, අයිතිකරු සහ එය කුලියට ගත් තැනැත්තා හෝ ඒ බෝට්ටුවේ ගමන් කරනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, එම එක් එක් තැනැත්තා මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා වූ බන්ධනාගාර ගත කිරීමකට හෝ මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති ධීවර බෝට්ටුවේ දිග ප්‍රමාණය මත පදනම්ව මෙහි II වන උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති මුදලට නොඅඩු දඩයකට යටත් විය යුතු ය.

**අනන්‍ය ආර්ථික කලාපය තුළ දී 4 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීම වරදක් බව.**

15ආ. 4 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය වන අයුරින් ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපය තුළ දී යම් විදේශීය ධීවර බෝට්ටුවක් භාවිත කරනු ලබන අවස්ථාවක දී ඒ බෝට්ටුවේ නෞකාධිපති, අයිතිකරු සහ එය කුලියට ගත් තැනැත්තකු ඇත්නම් ඔහු හෝ ඒ බෝට්ටුවේ ගමන් ගන්නා යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී, ඒ එක් එක් තැනැත්තා මෙහි III වන උපලේඛනයේ I වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති ධීවර බෝට්ටුවේ දිග ප්‍රමාණය මත පදනම්ව මෙහි III වන උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති මුදලට නොඅඩු දඩයකට යටත් විය යුතු ය.

**අනන්‍ය ආර්ථික කලාපය තුළ දී 5 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීම වරදක් බව.**

15ඇ. 5 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය වන අයුරින් ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපය තුළ යම් විදේශීය ධීවර බෝට්ටුවක් භාවිත කරනු ලබන අවස්ථාවක දී, ඒ බෝට්ටුවේ නෞකාධිපති, අයිතිකරු සහ එය කුලියට ගත් තැනැත්තකු ඇත්නම් ඔහු හෝ ඒ බෝට්ටුවේ ගමන් ගන්නා යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී ඒ එක් එක් තැනැත්තා මෙහි IV වන උපලේඛනයේ I වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති ධීවර බෝට්ටුවේ දිග ප්‍රමාණය මත පදනම්ව

මෙහි IV වන උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති මුදලට නොඅඩු දඩයකට යටත් විය යුතු ය.

වරදකට ආධාර දීම සහ අනුබල දීම.

15ඈ. මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීම සඳහා ආධාර සහ අනුබල දෙනු ලබන හෝ යම් වරදක් සිදු කිරීමට තැත් කරනු ලබන හෝ මේ පනත යටතේ වරදක් වන යම් ක්‍රියාවක් සිදුකරනු ලබන හෝ වැඩිදුරටත් යම් වරදක් සිදුකරනු ලබන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ පහළොවකට නොඅඩු දඩයකට යටත් විය යුතු ය.

මාසයක් තුළ නඩු කටයුතු අවසන් කිරීම.

15ඉ. මේ පනත යටතේ සිදුකරන ලද යම් වරදකට අදාළ යම් නඩු කටයුත්තක් එවැනි යම් නඩු කටයුත්තක් මහෙස්ත්‍රාත් අධිකරණයක පවරන ලද දින සිට මාසයක කාලයක් ඇතුළත අසා අවසන් කළ යුතු ය.

කිසිදු තැනැත්තකු ඇප මත නිදහස් නොකළ යුතු බව.

15ඊ. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, 15 වන වගන්තිය හෝ 15අ වගන්තිය යටතේ වරදකට චෝදනා ලැබූ හෝ චූදිතයකු වූ කිසිදු තැනැත්තකු ඇප මත නිදහස් නොකළ යුතු ය.

බෝට්ටුව, ධීවර ආම්පන්න යනාදිය නඩු විභාගය අවසන් වන තෙක් රඳවා ගැනීම.

15උ. 13 (5) වන වගන්තියේ අතුරු විධානයේ ඇතුළත් විධිවිධානවලට යටත්ව, 15, 15අ, 15ආ, 15ඇ සහ 15ඈ වගන්ති යටතේ යම් වරදක් සිදු කිරීමේ දී සම්බන්ධ කරගනු ලැබූ හෝ භාවිත කරනු ලැබ ඇති බවට සැක කරනු ලබන යම් බෝට්ටුවක්, ධීවර ආම්පන්න, උපකරණ, ගබඩාගත බඩු සහ යාත්‍රා බඩු නඩු විභාගය අවසන් කරනු ලබන තෙක් මුදා නොහැරිය යුතු ය.

නෞකාධිපති, අයිතිකරු යනාදී අය ඇතැම් අවස්ථාවල දී වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු බව.

15ඌ. කිසිදු නෞකාධිපතිවරයකු, බෝට්ටුවක අයිතිකරුවකු, එය කුලියට ගත් තැනැත්තකු හෝ බෝට්ටුවේ ගමන් ගන්නා යම් තැනැත්තකු ඔහුගේ දැනීමකින් තොරව ඒ වරද සිදු කරනු ලැබූ බවට හෝ ඔහුගේ කර්තව්‍යයන්ගේ ස්වභාවය සහ අදාළ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන ඒ වරද සිදු කිරීම වැළැක්වීමට ඔහු නිසි උද්යෝගයෙන් ක්‍රියා කරනු ලැබ ඇති බවට ඔප්පු කර ඇතිවිට මේ පනත යටතේ වරදකට වරදකරුවකු ලෙස සලකනු නොලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ “ජූරි සභාවක් නොමැතිව මහාධිකරණ විනිශ්චයකාරවරයකු ඉදිරියේ නඩු විභාගයකින් පසු” සහ “රුපියල් හත්ලක්ෂ පනස් දහසක් නොඉක්මවන දඩයකට” යන වචන වෙනුවට පිළිවෙළින් “මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ නඩු විභාගයකින් පසු” සහ “රුපියල් හත්ලක්ෂ පනස් දහසකට නොඅඩු සහ රුපියල් මිලියන හැත්තෑ පහකට නොවැඩි දඩයකට” යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(i) ඒ වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:-

“(ඈ) යාත්‍රාවේ ගමන් කිරීමට යම් බලයලත් නිලධරයකුට හෝ ඔහුගේ සහායකයන්ට ප්‍රමාණවත් පහසුකම් ලබාදීම හෝ ඒ බෝට්ටුවට ඇතුල්වන අවස්ථාවේදී හෝ ඒ බෝට්ටුවේ ගමන් ගන්නා අවස්ථාවේ දී ඒ නිලධරයාට සහ සහායකයන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් සැපයීම පැහැර හරින්නා වූ,”;

(ii) “ජූරි සභාවක් නොමැතිව මහාධිකරණ විනිශ්චයකාරවරයකු ඉදිරියේ” සහ “රුපියල් විසිපන් දහසක් නොඉක්මවන දඩයකට” යන වචන වෙනුවට “මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ” සහ “මෙහි V වන උපලේඛනයේ I වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති ධීවර බෝට්ටුවේ දිග ප්‍රමාණය මත පදනම්ව

මෙහි V වන උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති මුදලට නොඅඩු දඩයකට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු යඃ-

"සියලු වැරදි සංඥෙය හා ඇප ලබා දිය නොහැකි වැරදි විය යුතු බව.

17අ. මේ පනත යටතේ සිදු කරන ලද සියලු වැරදි 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංඥෙය සහ ඇප ලබා දිය නොහැකි වැරදි විය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ "අධිකරණය" යන වචනය වෙනුවට "මහෙස්ත්‍රාත් අධිකරණය" යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේඃ-

(i) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "අභියාචනාධිකරණය" යන වචනය වෙනුවට "මහාධිකරණය" යන වචනය ආදේශ කිරීමෙන් ;

(ii) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

‘‘(2) (1) වන උපවගන්තිය යටතේ රජය සතු කරනු ලැබූ යම් බෝට්ටුවක, ධීවර ආම්පන්නවල, මසුන්, ජලජ ශාක, උපකරණ, ගබඩාගත බඩු හෝ යාත්‍රා බඩුවල සන්තකය අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ලබාගත යුතු අතර, ඔහු විසින් සුදුසු යයි සිතනු ලබන පරිදි ඒවා විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 19අ, 19ආ සහ 19ඇ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා පිළිවෙලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19අ, 19ආ සහ 19ඇ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය:-

"අත්හැර දමන ලද විදේශීය ධීවර බෝට්ටු.

19අ. ධීවර ආම්පන්න, මසුන්, ජලජ ශාක, උපකරණ, ගබඩාගත බඩු සහ යාත්‍රා බඩු සමග යම් අත්හැර දමන ලද විදේශීය ධීවර බෝට්ටුවක් මේ පනත යටතේ වරදක් සිදු කිරීමට සම්බන්ධ බවට වන සැකය මත තහනමට ගන්නා අවස්ථාවක දී, නියමිත කාලසීමාවක් තුළ එකී බෝට්ටුවට හිමිකම්පෑමක් සිදුකර ඇත්නම් මිස, එය රජයට නිරපේක්ෂ වශයෙන් පැවරිය යුතු ය.

පරීක්ෂණයකින් පසු අත්හැර දමන ලද විදේශීය ධීවර බෝට්ටුව නිදහස් කිරීම.

19ආ. (1) යම් නියමිත කාලසීමාවක් තුළ දී එවැනි යම් බෝට්ටුවක අයිතිකරු, නෞකාධිපති හෝ එය කුලියට ගත් තැනැත්තකු ඇත්නම් ඒ තැනැත්තා විසින් ඒ අත්හැර දමන ලද විදේශීය ධීවර බෝට්ටුවට, ධීවර ආම්පන්නවලට, මසුන්ට, ජලජ ශාකවලට, උපකරණවලට, ගබඩාගත බඩු හෝ යාත්‍රා බඩුවලට හිමිකම් පෑමක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, මේ පනත යටතේ යම් වරදක් සිදුකිරීම සඳහා ඒ බෝට්ටුව භාවිත නොකළ බවට යම් පරීක්ෂණයකින් පසු මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත්වීමෙන් පසුව ඒ බෝට්ටුව හෝ ඒ බෝට්ටුවේ ඇති යම් අයිතම මුදාහැරීම සඳහා ආඥාවක් කිරීම හෝ මේ පනතේ 13(5) වන වගන්තිය යටතේ සිදුකරන ලද යම් ආඥාවකින් පසුව ඒවා අලෙවි කර ඇත්නම් ඒවායෙන් ලැබූ ඉපැයුම මහෙස්ත්‍රාත්වරයා ඉදිරිපිට දී ඒ බෝට්ටුවට හෝ ඒ බෝට්ටුව තුළ ඇති යම් අයිතමවලට ඇති තම නීතිමය හිමිකම ඔප්පු කරනු ලබන යම් හිමිකම්පාන්නකුට මුදාහැරීම පිණිස මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(2) අත්හැර දමන ලද විදේශීය ධීවර බෝට්ටුවට සහ ඒ තුළ ඇති යම් සියලු අයිතමවලට අදාළව රජය විසින් දරන ලද සියලු වියදම් හිමිකම්පාන්නා විසින් ගෙවිය යුතු ය.

අත්හැර දමන ලද විදේශීය ධීවර බෝට්ටුවක්, විදේශීය ධීවර බෝට්ටුවක් ලෙස සලකනු ලැබිය යුත්තේ කවර අවස්ථාවක දී ද යන වග.

19ඇ. යම් තැනැත්තකු හෝ අස්ථිත්‍යයක් විසින් 4 වන වගන්තිය සහ 5 වන වගන්තිය ඇතුළුව මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් උල්ලංඝනය කර ඇති බව යම් විමර්ශනයක් මගින් අනාවරණය වූ අවස්ථාවක දී, 15, 15අ, 15ආ සහ 15ඇ වගන්ති ඇතුළුව මේ පනතේ වෙනත් යම් විධිවිධානයක කාර්ය සඳහා යම් අත්හැර දමන ලද විදේශීය ධීවර බෝට්ටුවක්, විදේශීය ධීවර බෝට්ටුවක් ලෙස සලකනු ලැබීම 19අ සහ 19ආ වගන්ති මගින් බැහැර නොකළ යුතු ය.".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"වැරදි සමථයකට පත් කිරීම.

20. (1) මේ පනතේ විධිවිධාන උල්ලංඝනය වන පරිදි යම් තැනැත්තකු ක්‍රියාකර ඇති බවට විශ්වාස කිරීමට අධ්‍යක්ෂ-ජනරාල්වරයාට ප්‍රමාණවත් සාක්ෂි පවතින අවස්ථාවක දී ඔහු විසින්-

(අ) ඒ වරද ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපය තුළ පළමු වරට සිදුකරන ලද වරදක් වන්නා වූ විට මේ පනතේ 20අ වගන්තිය යටතේ පත් කරන ලද මණ්ඩලයේ නිර්දේශය මත;

(ආ) ඒ උල්ලංඝනය කිරීම සිදු වූ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්,

දණ්ඩනයක් පැනවීම සුදුසු වේ නම්, ඒ තැනැත්තා වෙත, දැන්වීම ලැබුණු දින සිට මාස එකක කාල සීමාවක් ඇතුළත පෙනී සිට තමාට ද ඩුවම් පැනවීම නොකළ යුත්තේ මන්ද යන්න පිළිබඳව හේතු දක්වන ලෙසට නියම කරමින් නියමිත ආකෘතිය අනුව වූ දැන්වීමක් භාර දීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) ඒ දැන්වීම භාරදෙනු ලැබූ තැනැත්තා ඒ දැන්වීම ලැබුණු දින සිට මාස එකක කාලයක් ඇතුළත ඉදිරිපත්ව මේ පනතේ විධිවිධාන උල්ලංඝනය වන පරිදි තමා විසින් ක්‍රියාකර ඇති බවට පිළිගනු ලැබූ අවස්ථාවක දී, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඒ තැනැත්තා විසින් ගෙවීමට යටත් වන්නා වූ මේ පනත යටතේ පනවනු ලැබිය හැකි උපරිම දණ්ඩනයෙන් තුනෙන් එකකට නොවැඩි දඩයක් ඒ තැනැත්තා වෙත පනවනු ලැබිය යුතු ය.

(3) එවැනි යම් දැන්වීමක් භාරදෙනු ලැබූ තැනැත්තකු විසින් ඒ දැන්වීම ලැබුණු දින සිට මාස එකක කාලයක් ඇතුළත ඒ දණ්ඩනය පැනවීමට එරෙහිව ඔහුට හේතු දැක්වීමට ඇති බවට ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක දී, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නොපමාව නියමිත ආකාරයකින් ඒ කාරණය පිළිබඳ විභාග කර තීරණය කිරීමට කටයුතු කරගෙන යා හැකි ය.

(4) අධ්‍යක්ෂ-ජනරාල්වරයා එම ඉදිරිපත් කරන ලද හේතු පිළිබඳව සෑහීමකට පත් නොවන අවස්ථාවක දී ඔහු විසින් ඒ සඳහා ස්වකීය හේතු දක්වමින් මේ වගන්තියේ (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති දණ්ඩනය පනවනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය යටතේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් යම් තැනැත්තකු වෙත දණ්ඩනයක් පනවනු ලබන අවස්ථාවක දී, ඒ දණ්ඩනය පිළිබඳ තොරතුරු දක්වමින් ඔහු විසින් නියමිත ආකෘතියකින් වූ දැන්වීමක් ඒ තැනැත්තා වෙත භාර දීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(6) අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ යම් තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ ඒ තීරණය ලැබුණු දින සිට දින තිහක් ඇතුළත (මෙහි මින්මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(7) අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ තීරණය සහ වරද සිදු කරනු ලැබ තිබූ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසුව ලේකම්වරයා විසින් -

(අ) අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ තීරණය තහවුරු කරමින් අභියාචනයට අවසර ලබා නොදීම;

(ආ) අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ තීරණය ඉවත දමා අභියාචනයට අවසර දීම;

(ඇ) අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ තීරණයේ යම් සංශෝධනයකට, වෙනස් කිරීමකට හෝ විවිධත්වයකට යටත්ව අභියාචනයට අවසර දීම,

කළ යුතු ය.

(8) ලේකම්වරයාගේ තීරණය, අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු අතර, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඒ තීරණය තමා වෙත දැනුම් දුන් දින සිට දින දාහතරක් ඇතුළත ඒ තීරණයට අනුකූලව පියවර ගනු ලැබිය යුතු ය.

(9) ලේකම්වරයාගේ ඒ තීරණය අතෘප්තියට පත් පාර්ශ්වය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(10) ලේකම්වරයාගේ ඒ තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් නීති ප්‍රශ්නයක් මත ඒ තීරණය දැනුම් දුන් දින සිට දින තිහක කාලයක් ඇතුළත අභියාචනාධිකරණය වෙත යම් අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(11) මෙම වගන්තිය යටතේ යම් වරදක් සමථයට පත් කිරීම දෙපාර්ශ්වයේ අත්සනින් යුතුව මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ලිඛිතව දැනුම් දිය යුතු අතර ඒ සඳහා චූදිතයකු නිදොස් කිරීමේ බලපෑම තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය.

"විශේෂඥ මණ්ඩලයක් පත් කිරීම.

20අ. (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ලේකම්වරයා විමසා නාවික ඉංජිනේරු විද්‍යාව, නීතිය සහ ගණකාධිකරණය යන ක්ෂේත්‍රවල දැනුම, නිපුණතාවය සහ පළපුරුද්ද ඇති තැනැත්තන් තුන් දෙනෙකුගෙන් සමන්විත විශේෂඥ මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු ය.

(2) 20 වන වගන්තිය යටතේ වරදක් සමථයට පත්කිරීමට අදාළව සැලකිල්ලට ගත යුතු කාරණා පිළිබඳව අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ඒ මණ්ඩලයේ කර්තව්‍යය විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, මුදල් අමාත්‍යවරයා විමසා ඔහු විසින් නිශ්චය කරනු ලැබිය යුතු යම් මුල්‍ය පාරිශ්‍රමික මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(i) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපය තුළ යම් වරදක් සිදුකිරීමට සම්බන්ධ වී ඇති විදේශීය ධීවර බෝට්ටුවක්, ඒ බෝට්ටුව සම්බන්ධයෙන් පවරනු ලැබ ඇති නඩු කටයුත්තක් අවසන් වන තෙක් රඳවා ගැනීමට මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලැබ

ඇති අවස්ථාවක දී, ඒ බෝට්ටුව මෙම වගන්තියට අනුකූලව සෑහීමට පත්විය හැකි බැඳුම්කරයක් හෝ වෙනත් ආකාරයේ ඇපයක් ලබාදීම මත නිදහස් කරන ලෙස බෝට්ටුවේ අයිතිකරු, අවසරපත්‍රය දරන්නා, නෞකාධිපති හෝ ඒ බෝට්ටුව සම්බන්ධයෙන් පත්කරනු ලැබ ඇති බලයලත් දේශීය නියෝජිතයකු විසින් එකී මහෙස්ත්‍රාත්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.".

(ii) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "විනිශ්චයකාරවරයකු විසින් අනුමත කරනු ලැබූ" යන වචන සහ "ඉල්ලීම කරනු ලැබූ මහාධිකරණ විනිශ්චයකාරවරයකු විසින්" යන වචන වෙනුවට "මහෙස්ත්‍රාත්වරයා විසින් අනුමත කරනු ලැබූ " සහ "ඉල්ලීම කරනු ලැබූ මහෙස්ත්‍රාත්වරයකු විසින්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(i) එම වගන්තිය (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන්;

(ii) නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(2) ශ්‍රී ලංකාවේ යම් සමුද්‍රීය කලාපයක් තුළ විදේශීය ධීවර බෝට්ටුවක් සොයා ගනු ලැබූ අවස්ථාවක දී සහ ඒ බෝට්ටුව තුළ වූ ධීවර ආම්පන්න නියමිත ආකාරයෙන් අසුරා නොමැති විට හෝ ඒ බෝට්ටුව තුළ තිබී මසුන් සොයා ගනු ලැබූ විට, එකී බෝට්ටුව එකී කලාපය තුළ ධීවර කටයුතුවලට භාවිත කර ඇති බවට සහ ඊට පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන තෙක් මේ පනතේ විධිවිධාන උල්ලංඝනය වන්නා වූ යම් කාර්යයක් සඳහා එකී බෝට්ටුව භාවිත කරනු ලැබ ඇති බවට පූර්ව නිගමනය කරනු ලැබිය හැකි ය.

(3) යම් අත්හැර දමන ලද විදේශීය ධීවර බෝට්ටුවක් සොයා ගනු ලැබූ අවස්ථාවක දී, ඊට පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන තෙක් මේ පනත

යටතේ යම් වරදක් සිදු කිරීම සඳහා භාවිත කරනු ලැබ ඇති බවට පූර්ව නිගමනය කරනු ලැබිය හැකි ය.''.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ "ශ්‍රී ලංකාවේ යම් අධිකරණ කලාපයක පැවැත්වෙන මහාධිකරණයක් විසින් විභාග කරනු ලැබිය හැකි ය." යන වචන වෙනුවට "වඩාත් ආසන්නතම හෝ පහසුම වරාය පිහිටා ඇති ප්‍රදේශයේ හෝ ආශ්‍රිත ප්‍රදේශයේ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයෙකු විසින් විභාග කරනු ලැබිය හැකි ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (එ) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(එ) (i) 1982, එක්සත් ජාතීන්ගේ සාගර නීතී සම්මුතිය මගින්;

(ii) 1993, ඉන්දීය සාගර ටූනා කොමිෂන් සභාව විසින්;

(iii) 1995, මත්ස්‍ය තොග පිළිබඳ ගිවිසුම යටතේ;

(iv) 2009, නීතිවිරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතු වැළැක්වීම, නතර කිරීම සහ පිටු දැකීම සඳහා වරාය රාජ්‍යයයන් විසින් ගන්නා පියවර පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආහාර සහ කෘෂිකර්ම සංවිධාන (FAO) ගිවිසුම යටතේ;

(v) ශ්‍රී ලංකාව පාර්ශ්වකරුවකු වී ඇති හෝ විය හැකි වෙනත් යම් සාධන පත්‍රයකින්,

නියම කළ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම.".

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 26අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 26අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"නියෝග උල්ලංඝනය කිරීම වරදක් විය යුතු බව.

26අ. 26 වන වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් යම් ආකාරයකින් උල්ලංඝනය කිරීම හෝ එවැනි නියෝගයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම මේ පනත යටතේ වරදක් විය යුතු අතර මහෙස්ත්‍රාත් අධිකරණයක මහෙස්ත්‍රාත්වරයකු විසින් එය විභාග කොට රුපියල් මිලියනයකට නොඅඩු දඩයකට එවැනි යම් තැනැත්තකු යටත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 27අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 27අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:-

"ත්‍යාග අරමුදලක් පිහිටුවීම.

27අ. (1) (මෙහි මින්මතු "ත්‍යාග අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) ධීවර ත්‍යාග අරමුදල යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අරමුදලක් තිබිය යුතු ය.

(2) ත්‍යාග අරමුදලේ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ-ජනරාල්වරයා වගකිව යුතු ය.

(3) 19 වන වගන්තිය යටතේ විකිණීමෙන් ඉපැයූ සියලු මුදල් ත්‍යාග අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් කලින් කල -

(අ) 3 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි යම් තැනැත්තකුට;

(ආ) යම් බලයලත් නිලධරයකුට; හෝ

(ඇ) යම් තොරතුරු සපයන්නෙකුට,

ඔහු විසින් සුදුසු යැයි සිතනු ලබන යම් මුදලක් ත්‍යාගයක් ලෙස ත්‍යාග අරමුදලින් ගෙවිය යුතු ය:

එසේ වුව ද, ඒ මුදල මේ පනත යටතේ නියම කරනු ලැබිය යුතු උපරිම මුදලට නොවැඩි විය යුතු ය.

(5) ත්‍යාග අරමුදලේ ගිණුම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව විගණකාධිපතිවරයා විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.".

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) "ජලජ ශාක" යන යෙදුමේ අර්ථ නිරූපණයට පෙරාතුවම පහත දැක්වෙන අළුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

""අත්හැර දමන ලද විදේශීය ධීවර බෝට්ටුව" යන්නට, කිසිදු තැනැත්තකු හෝ තැනැත්තන් ඒ තුළ නොමැති බෝට්ටුවක් ඇතුළත් වේ;";

(ii) "බලයලත් නිලධරයා" යන යෙදුමේ අර්ථනිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

""අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යන්නෙන්, 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ-ජනරාල්වරයා අදහස් වේ;";

(iii) "මසුන්" යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

""මසුන්" යන්නෙන්, ජීවත්ව සිටින හෝ ජීවත් නොවන, ජලයේ වාසය කරන ඕනෑම ජලජ හෝ සමුද්‍රීය සතෙකු අදහස් වන අතර, ඊට ඔවුන්ගේ බිත්තර, පැටව්, ඇස්වටයන් සහ එම සතුන්ගේ වර්ධන අවස්ථාවන් සහ ඔවුන්ගේ කොටස් ද, එසේ ම එක් ස්ථානයක වාසය කරන සත්ව විශේෂවලට අයත් සියලු ජීවීන් ද ඊට ඇතුළත් වේ;";

(iv) "මසුන් ඇල්ලීම" යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

""මසුන් ඇල්ලීම" යන්නට යම් ක්‍රමයකින් මසුන් ගැවසෙන ස්ථාන පිළිබඳ සොයා බැලීම, මසුන් ආකර්ශනය කර ගැනීම, මසුන් ගැවසෙන ස්ථාන නිශ්චය කර ගැනීම, මසුන් ඇල්ලීම, ලබාගැනීම හෝ මැරීම හෝ මත්ස්‍ය අස්වැන්න ලබා ගැනීම හෝ ජලජ ශාක රැස් කිරීම ඇතුළත් වන අතර මසුන් ඇල්ලීමට, ලබාගැනීමට හෝ මැරීමට තැත් කිරීම හෝ ජලජ ශාක රැස් කිරීම සඳහා තැත් කිරීම හෝ මෙහි මීන්පෙර සඳහන් කරනු ලැබ ඇති යම් ක්‍රියාවක් ශ්‍රී ලංකා ජල තීරය තුළ සිදු කිරීමට තැත් කිරීම ඊට ඇතුළත් වේ;";

(v) "දේශීය ධීවර බෝට්ටු" යන අර්ථ නිරූපණයේ "සහ 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ" යන වචන වෙනුවට "හෝ 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ;" යන වචන ආදේශ කිරීමෙන්;

(vi) "අදාළ කටයුතු" යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

""අදාළ කටයුතු" යන්න, ධීවර කටයුතු සම්බන්ධයෙන් යෙදෙන විට -

(අ) ශ්‍රී ලංකා ජල තීරය තුළ යම් බෝට්ටුවකින් හෝ යාත්‍රාවකින් වෙනත් බෝට්ටුවකට හෝ යාත්‍රාවකට මසුන් නැවත පැටවීම;

(ආ) ධීවර මෙහෙයුම් වලින් ලබා ගත් මසුන් හෝ ජලජ ශාක ගබඩා කිරීම, සකස් කිරීම, කල් තබා ගැනීම හෝ ප්‍රවාහනය කිරීම;

(ඇ) ධීවර බෝට්ටුවලට නැවත ඉන්ධන දැමීම හෝ සැපයීම හෝ ධීවර මෙහෙයුම්වලට අධාර හෝ උපකාරක වූ වෙනත් කටයුතු ඉටු කිරීම;

(ඈ) මුහුදේ දී අවශ්‍ය සේවක මණ්ඩල, ඉන්ධන, ආම්පන්න සහ වෙනත් සැපයුම් ලබාදීම;

(ඉ) ඉහත සඳහන් කිසිවක් සිදුකිරීමට තැත් කිරීම හෝ සූදානම් වීම,

ඇතුළත් වේ;";

(vii) "ලේකම්වරයා" යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

""ලේකම්වරයා" යන්නෙන් ධීවර විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් විය යුතු ය;'';

(viii) "ශ්‍රී ලංකා ජල තීරය" යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

""ශ්‍රී ලංකා ජල තීරය" යන්නෙන්-

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 2 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශනයකින් ශ්‍රී ලංකා දේශීය සමුද්‍රය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය;

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 4 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශනයකින් ශ්‍රී ලංකාවේ යාබද කලාපය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය;

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 5 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශනයකින් ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපය වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලැබූ ප්‍රදේශය;

(ඈ) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 9 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශනයකින් ශ්‍රී ලංකාවේ ඓතිහාසික ජල ප්‍රදේශය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය;

(ඉ) සියලු පොදු වරායවල්, ගංගා, විල්, කලපු, මෝය, දිය පාරවල්, වැව්, ජලාශ, පොකුණු, ඇලවල් සහ වෙනත් සියලු රට මැද පොදු හෝ අභ්‍යන්තර ජල ප්‍රදේශ,

අදහස් වේ.”.

**22.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

I වන උපලේඛනය

(15 වන වගන්තිය)

| **I වන තීරය** | **II වන තීරය** |
|---|---|
| *බෝට්ටුවේ දිග මීටර් වලින්* | *දඩය (රු. මිලියන)* |
| | *දේශීය ජල තීරය තුළ* |
| 15 ට අඩු | 5 |
| 15 ට වැඩි සහ 24 ට අඩු | 20 |
| 24 ට වැඩි සහ 45 ට අඩු | 100 |
| 45 ට වැඩි සහ 75 ට අඩු | 150 |
| 75 ට වැඩි | 175 |
| පරිපාලන දඩය | අදාළ නොවේ |

II වන උපලේඛනය

(15අ වගන්තිය)

| **I වන තීරය** | **II වන තීරය** |
|---|---|
| *බෝට්ටුවේ දිග මීටර් වලින්* | *දඩය (රු. මිලියන)* |
| | *දේශීය ජල තීරය තුළ* |
| 15 ට අඩු | 3 |
| 15 ට වැඩි සහ 24 ට අඩු | 15 |
| 24 ට වැඩි සහ 45 ට අඩු | 75 |
| 45 ට වැඩි සහ 75 ට අඩු | 120 |
| 75 ට වැඩි | 150 |
| පරිපාලන දඩය | අදාළ නොවේ |

III වන උපලේඛනය

(15ආ වගන්තිය)

| I වන තීරය | II වන තීරය |
|---|---|
| *බෝට්ටුවේ දිග මීටර් වලින්* | *දඩය (රු. මිලියන)* |
| | *අනන්‍ය ආර්ථික කලාපය තුළ* |
| 15 ට අඩු | 3 |
| 15 ට වැඩි සහ 24 ට අඩු | 15 |
| 24 ට වැඩි සහ 45 ට අඩු | 75 |
| 45 ට වැඩි සහ 75 ට අඩු | 120 |
| 75 ට වැඩි | 150 |
| පරිපාලන දඩය | මුල් දඩයෙන් 1/3 |

IV වන උපලේඛනය

(15ඇ වගන්තිය)

| I වන තීරය | II වන තීරය |
|---|---|
| *බෝට්ටුවේ දිග මීටර් වලින්* | *දඩය (රු. මිලියන)* |
| | *අනන්‍ය ආර්ථික කලාපය තුළ* |
| 15 ට අඩු | 1.5 |
| 15 ට වැඩි සහ 24 ට අඩු | 5 |
| 24 ට වැඩි සහ 45 ට අඩු | 50 |
| 45 ට වැඩි සහ 75 ට අඩු | 75 |
| 75 ට වැඩි | 100 |
| පරිපාලන දඩය | මුල් දඩයෙන් 1/3 ක් |

V වන උපලේඛනය

(17 වන වගන්තිය)

| **I** වන තීරය | **II** වන තීරය |
|---|---|
| *බෝට්ටුවේ දිග මීටර් වලින්* | *දඩය (රු.)* |
| 15 ට අඩු | 100,000 |
| 15 ට වැඩි සහ 24 ට අඩු | 200,000 |
| 24 ට වැඩි සහ 45 ට අඩු | 500,000 |
| 45 ට වැඩි සහ 75 ට අඩු | 1,500,000 |
| 75 ට වැඩි | 7,500,000 |